# 13. එළිය (ආලෝකය) සමඟ සෙල්ලම්

## ක්‍රියාකාරකම 1

- ළමයාගේ ඇස් රෙදි කඩකින් වසා යම් දෙයක් අතට දී එය හඳුනා ගන්නේ දැයි විමසන්න.
- ඇස් හා ආලෝකය නොමැති විට අපට යමක් නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වන බව පැහැදිලි කරන්න.

    උදා:- අන් අයගේ උදව් ලබා ගැනීමට සිදු වන බව.
    ඉගෙනුම් කටයුතු කිරීමට අපහසු බව.

- පහත දැක්වෙන ඒවා අතුරින් ඇසට හානි සිදු විය හැකි දේ ඇතුළත් පේළිවලට යටින් ඉරි අඳින්න.

    01. උල් සහිත ද්‍රව්‍ය වලින්
    02. ගින්දර වලින්
    03. පළා වර්ග ආහාරයට ගැනීමෙන්
    04. අධික ආලෝකයෙන්
    05. අඳුරේ වැඩ කිරීමෙන්
    06. විෂ සහිත දියර වර්ග වලින්
    07. සුව නින්දක් ලැබීමෙන්
    08. රතිඤ්ඤා දැල්වීමෙන්

- ඇසක රූපයක් ඇඳ පාට කිරීමට යොමු කරන්න.

# ක්‍රියාකාරකම 2

- සමාන ප්‍රමාණයේ මල් බඳුන් දෙකක් ගන්න.
- එම බඳුන් දෙකෙහි මුං ඇට බීජ දමා ජලය දමමින්  බීජ පැළ වන තෙක් තබන්න.
- බීජ පැළ වූ පසු ඉන් එකක් හිරු එළිය ඉහළින් වැටෙන ස්ථානයක තබන්න.
- අනෙක් බඳුන පෙට්ටියක බහා හිරු එළිය එක් පැත්තකින් පමණක් ලැබෙන සේ පෙට්ටියේ පැත්තකින් කවුළුවක් සකස් කරන්න.
- දින කීපයකට පසු නිරීක්ෂණය කරන්න.
- නිරීක්ෂණයෙන් පසු දුටු දේ චිත්‍රයට නඟන්න.

# ක්‍රියාකාරකම 3

- විදුලි පන්දමක් සපයා ගන්න.
- එය දල්වා ආලෝකය විහිදීම නිරීක්ෂණය කිරීමට දෙන්න.
- විදුලි පන්දමේ හිස කොටස ගලවා බල්බය විවෘත කොට බල්බය දල්වා නිරීක්ෂණය කිරීමට දෙන්න.
- ගැල වූ හිස කොටස නැවත සවිකර එළිය ඈතට විහිදෙනආකාරය නිරීක්ෂණය කිරීමට දෙන්න.
- මැද සිහින් සිදුරක් සහිතව සකස් කරගත් එකම ප්‍රමාණයේ සමචතුරස්‍රකඩදාසි කිහිපයකින් විවිධ ප්‍රමාණයේ ගොටු කිහිපයක් පිළියෙළ කරගන්න.
- එම එක් එක් ගොටුව තුළට විදුලි පන්දම ඇතුළු කරමින් ආලෝකය විහිදීම වෙනස්වන ආකාරය නිරීක්ෂණය කිරීමට දෙන්න.
- එක් එක් අවස්ථාවේ එළිය විහිදීම අඩු වැඩි වූ ආකාරය චිත්‍රයට නඟන්න.

# ක්‍රියාකාරකම 4

- වීදුරු පටි තුනක් ගන්න.
- ඒවා එකිනෙකට ආනතව බැඳ, කළු කඩදාසියකින් ආවරණය  කරන්න.
- විවෘතව ඇති එක් කෙළවරකට ටිෂූ කොළයක් අලවා ගන්න.




විවර වූ කෙළවරින් වර්ණවත් කඩදාසි කැබලි, කුඩා මල් පෙති ආදිය දමා රටා බලන්න.

# ක්‍රියාකාරකම 5

- සුදු පැහැති  සන කඩදාසියකින් / බ්‍රිස්ල් බෝඩයකින් තරමක් වෘත්ත කිහිපයක් කපා ගන්න. (විෂ්කම්භය 10cm පමණ වන )
- එය සමාන කොටස් 06කට බෙදා ගන්න.



- ❖ රූපයේ පෙනෙන ආකාරයට පාට කර ගන්න.
- ❖ රවුම මැද සිදුරක් සාදා ඒ තුලින් පැන්සල ඇතුල් කරන්න.
- ❖ එය කරකැවීමට සලස්වා දක්නට ලැබෙන දේ ලියන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

## ක්‍රියාකාරකම 6

- ❖ දරුවා අතට කැඩපතක් ( කණ්ණාඩියක්) ලබා දෙන්න.
- ❖ කැඩපතෙන් තමා පෙනෙන අයුරු හා
- ❖ කැඩපතෙන් පින්තූරයක් පෙනෙන අයුරු නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- ❖ එම අවස්ථා පෙනෙන අයුරු ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

## ක්‍රියාකාරකම 7

- විනිවිද පෙනෙන වර්ණ සෙලෝපේන් කඩදාසි වලින් වර්ණ රාමු කීපයක් සාදා ගන්න.



- ❖ වර්ණ රාමු පිටුපසින් විදුලි පන්දමක් අල්ලා ඒවා එකිනෙකෙහි එළි දැකීමට අවස්ථාව ලබා දෙන්න.
- ❖ මෙම වර්ණ රාමු තුනම එක මත එක තබා විදුලි පන්දම ඇල්ලූ විට සිදු වන දේ නිරීක්ෂණයට යොමු කරන්න. ඒ පිළිබඳ කතා කරන්න.

## ක්‍රියාකාරකම 8

- ❖ වර්ණවත් කඩදාසි (සෙලෝපින් කොළ) යොදා ගනිමින් සරල පහන් කූඩුවක් නිර්මාණය කරන්න.
- ❖ එහි ඇතුලේ ඉටි පන්දමක් දල්වා එළිය විහිදීම නිරීක්ෂණය කරන්න.